# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,814 — 1959 ජූලි 24 වැනි සිකුරාද — 24.7.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


## IV වැනි කොටස – පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 627 | මාගී කොම්පි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 629 |


## අතුරු ව්‍යවස්ථා

ඇල්.ජී.ඩී.—ජීසී. 14/39.

**ගම්සභා ආඥාපණත**

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ හලාවත දිස්ත්‍රික්කයේ යටකලන්පත්තු ගම් ප්‍රදේශයේ ගම්කාය්‍යී සභාව විසින් ඍම්පාදිතව 1947ක්වූ සැප්තැම්බර මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලනය සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමිය කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමිය විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය
කාය්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 ජූලි මස 14 දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

**ගොඩනැගිලි සහ මායිම් තාප්ප**

1. කිසිවකු විසින් ගම්ප්‍රදේශය ඇතුළත—

(අ) ඕනෑම ගම්බද කරත්ත පාරක් මැද සිට අඩි පහළොවක දුර ප්‍රමාණය ඇතුළත,

(ආ) යථා කාලයේදී ගම්බද කරත්ත පාරක් බවට පත්කරනු ලැබිය හැකියයි කාය්‍යී සභාව සභාව විසින් දැනුම්දෙනු ලැබ වාවූ ඕනෑම අඩි පාරක් මැද සිට අඩි පහළොවක දුර ප්‍රමාණය ඇතුළත, හෝ

(ඇ) මේ අතුරු ව්‍යවස්ථාවේ (ආ) උප ඡේදයේ සඳහන් කරන ලද අඩි පාරකින් බාහිරවූ ඕනෑම ගම්බද අඩිපාරක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුළත හෝ කිසියම් අළුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

2. අඩුගණනේ දවස් තිහකටවත් කලින් ඒ පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක් ප්‍රධානතුමාට භාරනොකර කිසිවකු විසින් 1 ඡේදයේ සඳහන් කරන ලද යම් කරත්ත පාරක් හෝ අඩිපාරක් අයිනේ කිසිම ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් නොසෑදිය යුතුයි.

**දඩාවතේ යන ගවයන්**

3. කාය්‍යී සභාව විසින් සම්මත කරගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 24 වෙනි කාණ්ඩයේ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ යටතේ දඩාවතේ යන සතුන් දමන කොටුවේ දමන ලද යම් සතකු ඉන් ඉවත්කර ගෙන යාමට මත්තෙන් අය කළ යුතු වූ ගාස්තුව පහත දැක්වෙන සේ ගණන් බලා අයකළ යුතුයි:—

(අ) සතුන් දමන කොටුවට ඇතුල් කළ එක් සතකුට රුපියල් හතරකි.

(ආ) ඉහත සඳහන් අය කිරීමට අමතර වශයෙන් සතුන් දමන කොටුවෙහි ගතකරන එක් රාත්‍රියකට එක් සතකුට රුපියල් 3කි.

(ඉ) දහවල් කාලයේ සතුන් දමන කොටුවෙහි තබන එක් එක් පැය හයකට එක් සතකුට රුපියල් එකයි සත පණහකි.

**මහජන නිරිහැර අඩුකිරීම**

4. ගම් ප්‍රදේශයේ පාලන බල සීමාව තුළ කිසිවකු විසින් යම් ග්‍රැම ෆෝන් යන්ත්‍රයක හෝ ගුවන් විදුලි යන්ත්‍රයක් හෝ ශබ්ද වාහිණී යන්ත්‍රයක් හෝ වෙනත් එබඳු යන්ත්‍රයක් ක්‍රියාකරවීමෙන් හෝ ක්‍රියා කරවීමට සැලැස්වීමෙන් හෝ වෙනත් කෙනෙකුට ක්‍රියා කර වීමට ඉඩදීමෙන් අහල පහල පිහිටි ඉඩම්වල පදිංචිකාරයින්ට කන් දෙස් ක්‍රියාවක් සිදුවන පරිද්දෙන් අධික ලෙස හෝ නැවත නැවතත් හෝ නොරතෝංචියක් නැතිව හෝ යම් ශබ්දයක් ඇතිකිරීම හෝ නැවත උපදවීම හෝ ඇතිකිරීමට හෝ නැවත ඉපදවීමට සැලැස්වීම හෝ නොකට යුතුයි.

5. යම්කිසි වීථියක්, පොදු ස්ථානයක්, කඩයක් හෝ වෙළඳාම කරන ස්ථානයක හෝ මහජනයා පැමිණෙන්නාවූ යම් වීථියක් හෝ පොදු ස්ථානයක් අසල පිහිටියාවූ යම් ස්ථානයක් සහ එකී ස්ථාන වලින් බාහිරවූ යම් ස්ථානයක් ඉහත සඳහන් පරිදි යම් යන්ත්‍රයක් ක්‍රියා කරවන්නාවූ හෝ ක්‍රියා කරවීමට සලස්වන්නාවූ හෝ වෙනත් කෙනෙකුට ක්‍රියා කරවීමට ඉඩදෙන්නාවූ යම් කිසිවෙකුට විරුද්ධව—

(අ) එය කන්දොස් ක්‍රියාවක්ය කියා ඒ අසල පිහිටි ගෙවල්වල පදිංචිව සිටින ගෘහ මූලිකයන් තුන්දෙනෙකුට නොඅඩු ගණනක් විසින් ඒ බව ලියවිල්ලකින් ප්‍රධානතුමාට පැමිණිලි කරනු ලැබද,

(ආ) ප්‍රධානතුා විසින් තමාට ලැබුණු පැමිණිලිවල සවභාවයත් දක්වා ලියවිල්ලක් ඒ අයට භාරකොට වහම හෝ නියමිත කාලසීමාවක් ඇතුළතදී හෝ ඒ කන්දොස් ක්‍රියාව අඩුකළ යුතුයයි නිවේදනයක් කරනු ලැබ හා

(ඉ) කාරණයේ හැටියට ඒ දැන්වීම ලැබුණු හැටියේම හෝ එහි සඳහන් කාලසීමාව ඇතුළතදී හෝ ඒ අය විසින් එහි දැක්වෙන නියමයන් ඉෂ්ට නොකර හෝ ඉෂ්ට කිරීම පැහැර හැර තිබේනම් මිස නැතිනම්, 4 වැනි ව්‍යවස්ථාව යටතේ නඩු පැවරිය යුතු නැත.

6. මේ අතුරු ව්‍යවස්ථාවල :—

"ප්‍රධානතුමා" යනුවෙන් කාය්‍යී සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාය්‍යී සභාව" යනුවෙන් ගම් ප්‍රදේශයේ ගම්කාය්‍යී සභාව අදහස් කරනු ලැබේ.

"ආඥාපණත" යනුවෙන් ගම්සභා ආඥාපණත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

"ගම් ප්‍රදේශය" යනුවෙන් හලාවත දිස්ත්‍රික්කයේ යටකලන් පත්තු ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

---

ජී. බී. 14/1/1.

## ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තොට ගම්ප්‍රදේශයේ ගම්කාය්‍යී සභාව විසින් සම්පාදිතව, 1947තේ සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මඳක් වෙනස් කරන ලද එකී වගන්තියෙන් (3) උප වගන්තියෙන් පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමිය කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර, එතුමිය විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කාය්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 ජූලි මස 14 වැනි දින
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

පහත දක්වන කර්මාන්තයන් අප්‍රසන්නවූ කර්මාන්ත හැටියට සලකනු ලැබේ :—

(1) මාළු වියලා සකස් කිරීම,
(2) ජාඩි හෝ කරවල ගබඩා කිරීම,
(3) තොග ගණනේ විකිණීම සඳහා නරක් විය හැකි ආහාර ද්‍රව්‍ය හා සිල්ලර බඩු ගබඩා කිරීම,
(4) කොම්පෝස්ට් නොහොත් කෘතික පොහොර සෑදීම,
(5) රබර් වේලීම හෝ සකස් කිරීම,
(6) විනාකිරි සෑදීම,
(7) සබන් සෑදීම,
(8) හම් පදම්කරන ස්ථානයක් තබා ගැනීම,
(9) පුවක් වියලා සකස් කිරීම,
(10) සතුන්ගේ ලේ හෝ මලකුණු උනු කිරීම,
(11) සතුන්ගේ හම් ගබඩා කිරීම
(12) ඇටකටු ගබඩා කිරීම,
(13) මාළු අයිස් දැමීම,
(14) පොල්ලෙලි පෙගවීම සඳහා (පොල්ලෙලි) කොටුවක් තබා ගැනීම,
(15) ලැලි පොගවා සකස් කිරීම,
(16) ෂීට් රබර් හෝ ක්‍රේප් රබර් සෑදීම හෝ දුම්ගැස්සීම,
(17) කෘතිම පොහොර හෝ ඒවා සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගබඩාකර තැබීම,
(18) පැණි හකුරු කර්මාන්තය,
(19) රා එකතු කරන ස්ථානයක් තබා ගැනීම,
(20) සෝඩා සෑදීම,
(21) බීඩි සෑදීම,

පහත දක්වන කර්මාන්තයන් අන්තරාදායක කර්මාන්ත හැටියට සලකනු ලැබේ :—

(1) සෝඩා, ලැමනඩ් ආදි සිසිල් බීම සෑදීම,
(2) කොප්පරා සෑදීම,
(3) යන්ත්‍ර සූත්‍ර මාර්ගයෙන් තෙල් සිඳීම,
(4) කබොක්, බොරළු හෝ කලුගල් ලබාගැනීමට වළක් හෑරීම,
(5) කොප්පරා ගබඩා කිරීම,
(6) පිදුරු ගබඩා කිරීම,
(7) පොල් කපා සකස් කිරීම,
(8) මිනිරන් ගබඩා කිරීම හෝ වියළා සකස් කිරීම
(9) වළක් කැණීමෙන් හුනුගල් ලබා ගැනීම,
(10) යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් සිඳීම,
(11) සෙක්කුවෙන් පොල්තෙල් සිඳීම,
(12) හුණුගල් පිළිස්සීම හෝ ගබඩා කිරීම,
(13) කෙඳිවගී නෙලීම හෝ ගබඩා කිරීම,
(14) කපු පුළුන්, නූල් ආදිය ගබඩා කිරීම,
(15) කුරුඳු තෙල් සිඳීම,
(16) ලී මඩුවක් තබා ගැනීම,
(17) භූමිතෙල් ගබඩාවක් තබාගැනීම,
(18) හාල් මෝලක් තබා ගැනීම,
(19) කම්මලක් තබා ගැනීම,
(20) මුද්‍රණ යන්ත්‍රාලයක් තබා ගැනීම,
(21) අම්ලකර වායුව පාවිච්චිකරන කම්මලක් තබා ගැනීම,
(22) ස්වර්ණාභරණ සෑදීම,

පහත දක්වන කර්මාන්ත අප්‍රසන්න හා අන්තරාදායක කර්මාන්ත හැටියට සලකනු ලැබේ :—

(1) කෙඳිවගී සායම් කිරීම,
(2) ගඩොල් හෝ උළු පිළිස්සීම,
(3) බැටරි චාජ් කිරීම,
(4) හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබලි කිරීම,
(5) අඟුරු ලබාගැනීම පිණිස පොල්කටු පිළිස්සීම.

---

ජී.බී. 14/12/6.

## ගම්සභා ආඥාපණත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ නාගොඩ ගම් ප්‍රදෙශයේ ගම් කාය්‍යී සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරන ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන හා නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමිය කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමිය විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කාය්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1959 ජූලි 14 වැනි දින
කොළඹ,

### අතුරු ව්‍යවස්ථා

#### ගොඩනැගිලි සහ තාප්ප තැනීම

1. (1) කිසිවකු විසින් ගම් ප්‍රදෙශය තුළ—

(ඒ) ඕනෑම ගම්බද කරත්ත පාරක් මැද සිට අඩි දහඅටක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(බී) යථා කාලයේදී ගම්බද කරත්ත පාරක් බවට පත්කරනු ලැබිය හැකියයි නාගොඩ ගම්කාය්‍යී සභාව විසින් දැනුම් දෙනු ලැබූ වාවූ ඕනෑම අඩි පාරක් මැද සිට අඩි දහඅටක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(සී), (බී) ඡේදයේ සඳහන් කරන ලද පාරකින් බාහිරවූ ඕනෑම ගම්බද අඩි පාරක් හෝ දෙවට පාරක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුළත අළුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

2. කිසිවකු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමකින් දවස් තිහකට කලින් ඒ පිළිබඳව නාගොඩ ගම්කාය්‍යී සභාවේ ප්‍රධානතුමාට දැනුම් නොදී මේ අතුරු ව්‍යවස්ථාවේ (1) ඡේදයේ සඳහන් කරන ලද ඕනෑම කරත්ත පාරක් හෝ අඩි පාරක් හෝ දෙවට පාරක් අයිනේ කිසිම ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත,

# විවිධ දැන්වීම්

## පාතදුම්බර පලිස්පත්තුව බටහිර ගම්කාර්‍ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත උප ලේඛනයෙහි සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1959යේ වර්ෂයේ මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බැවින්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන පාතදුම්බර පලිස්පත්තුව බටහිර ගම්කාර්‍ය සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණු නිසාද යන වග ඇතුළත් ලියකියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම් ගැසට් පත්‍රයේ පළවන දින සිට සති දෙකක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරන 1947 අංක 44 දරන ආඥාපණතින් සංශෝධිතවූ අංක 6 දරන ආඥාපණත යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උප ලේඛනය

ඉල්ලුම්කරුගේ නම : ආනා බුහාරි.

ස්ථානය : අංක 14, හුලුගඟ, මඩුල්කැලේ.

වෙළඳාම : හරක් මස්.

එච්. ඇම්. හේරත් බංඩා,
පලිස්පත්තුව බටහිර ගම්සභාපති තැන.

ගම්සභා කාර්‍යාලය,
නාරන්පනාව, 15.7.59.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.